# 2024 උසස් පෙළ දිස්ත්‍රික් විශිෂ්ටයෝ

## අම්මයි තාත්තයි මගේ ජයග්‍රහණයේ නියමුවන් වුණා

### මොනරාගල දිස්ත්‍රික් ගණිත අංශ පළමුවැන්නා සෙහාන් මධුරංග කුලසිරි



**ඌව වෙල්ලස්ස විශේෂ - ඩී.එස් ගුණතිලක**

මෙවර අ.පො.ස. උසස් පෙළ විභාගයේ ගණිත අංශයේ මොනරාගල දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය මොනරාගල රාජකීය ජාතික පාසලේ සෙහාන් මධුරංග කුලසිරි ශිෂ්‍යයා හිමි කරගෙන ඇත. උසස් පෙළ විභාගයට දෙවැනි වරට ඉදිරිපත් වූ සෙහාන්, දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය ලබා ගනිමින් විශිෂ්ට ලෙස සමත්ව ඇති අතර, ඔහු සිය ජයග්‍රහණය සම්බන්ධයෙන් මෙසේ පැවසීය. "මගේ ජයග්‍රහණයේ නියමුවන් වූයේ මගේ මව සහ පියායි. නංගිලා තුන් දෙනාගේ සහයෝගයත් ලැබුණා. විශේෂයෙන් රාජකීය ජාතික පාසලේ විදුහල්පති චමින්ද දේශප්‍රිය මහතා ඇතුළු ගුරු මණ්ඩලයේ ආශීර්වාදය නිරන්තරයෙන් ලැබුණා. නයන්ප්‍රිය උදයවීර, නිශ්ශංක බණ්ඩාර, මධුශංක අබේසේකර යන ගුරුභවතුන් මගේ ජයග්‍රහණයට අඩිතාලම දැම්මා. විශ්වවිද්‍යාලයට පිවිස ඉංජිනේරුවරයකු වී රටට සේවය කිරීම මගේ අරමුණයි."

## උසස් රැකියාවක් කර රටට සේවයක් කරනවා

### මොනරාගල දිස්ත්‍රික් වාණිජ අංශ පළමුවැන්නා ජී.වී.පී. ධනුෂ්ක



**ඌව වෙල්ලස්ස විශේෂ - ඩී.එස්. ගුණතිලක**

2024 අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ වාණිජ අංශයේ ප්‍රථම ස්ථානය හඳපානාගල මහා විද්‍යාලයේ ජී.වී.පී. ධනුෂ්ක ශිෂ්‍යයා හිමි කරගෙන ඇත.

හඳපානාගල ප්‍රදේශයේ අතිදුෂ්කර ගම්මානයක් වූ උල්කන්ද ප්‍රදේශයේ උපන් ධනුෂ්ක තම ජයග්‍රහණය පිළිබඳව මෙසේ අදහස් දැක්වීය.

"මම හඳපානාගල උල්කන්ද කෙන්හත ගම්මානයේ ඉපදුණේ. බොහෝ දුෂ්කරතා මැද මම මේ ජයග්‍රහණය ලබා ගත්තා, අපේ ගම්මානවලට නිතර වනඅලි පැමිණෙනවා. ගමේ බොහෝ අයගේ ජීවනෝපාය ගොවිතැනයි. විදුහල්පති කේ.එම්.වී.එස්. බණ්ඩාර මහතාගේ සහ ගුරු මණ්ඩලයේ ආශීර්වාදය මැද අධ්‍යාපනය ලැබුවා.

මගේ ගුරුවරුන් ලෙස චන්න, ලකී කුලරත්න, ප්‍රදීප්, සුරංග, චතුරිකා යන ගුරුභවතුන් කටයුතු කළා. මගේ ජයග්‍රහණයේ නියමුවන් වන්නේ ඔවුන්. සෙවණැල්ලක් සේ මවුපියන් දෙදෙනා ළඟින් සිටිමින් මාව දිරිමත් කළා. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසුව උසස් රැකියාවක් කරමින් රටට සේවය කිරීමට බලාපොරොත්තු වෙනවා."

## විශ්වවිද්‍යාල මහාචාර්යවරියක් වීමට බලාපොරොත්තු වෙනවා

### මොනරාගල දිස්ත්‍රික් කලා අංශ පළමුවැන්නා ආර්.එම්. සුරංගි අභිරුචනිකා



**ඌව වෙල්ලස්ස විශේෂ - ඩී.එස්. ගුණතිලක**

මොනරාගල දිස්ත්‍රික්කයේ උසස් පෙළ ප්‍රථම ස්ථානය මොනරාගල අධ්‍යාපන කලාපයේ බඩල්කුඹුර නිශ්ශංක ජාතික පාසලේ ආර්.එම්. සුරංගි අභිරුචනිකා ශිෂ්‍යාව හිමි කරගෙන ඇත. ඇය සමස්ත ලංකා මට්ටමෙන් 18 වැනි ස්ථානය ද හිමි කරගෙන තිබේ. කුඩා කාලයේ සිටම ඉගෙනීමට දක්ෂතාවන් දැක්වූ ඇය විෂය කටයුතුවලට අමතරව බාහිර ක්‍රියාකාරකම්වලදී ද ඉදිරියෙන් සිට ඇති ශිෂ්‍යාවකි. ශිෂ්‍ය නායිකාවක් ද වන ඇය බොහෝ දුෂ්කරතා මැද මෙම ජයග්‍රහණය හිමි කරගෙන තිබේ.

තම ජයග්‍රහණය පිළිබඳව ඇය මෙසේ පැවසුවාය.

"විදුහල්පති ජේ.එම්.එස්.බී. ජයවර්ධන මහතා ඇතුළු ගුරු මණ්ඩලය මට නිරන්තරයෙන් ආශීර්වාද කළා. අම්මයි, තාත්තයි, නංගියි මට බොහෝ උපකාර කළා. සිංහල විෂය භාර කේ. සුගතවංශ හාමුදුරුවෝ සහ ඩී.එම්. පත්මලතා භූගෝල විද්‍යාව ඉගැන්වූ ඩබ්ලිව්.එම්. දීපා ශ්‍රියානි සහ

ආර්.එම්.සී. රත්නායක, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ඉගැන්වූ කේ.එම්. අනුර දිලිප් මුතුකුමාර, එච්.එම්. චන්දිමා සඳමාලි යන ගුරු මෑණිවරුන් සහ ගුරු පියවරුන් මගේ ජයග්‍රහණයේ නියමුවන්. මගේ අනාගත බලාපොරොත්තුව විශ්වවිද්‍යාල මහාචාර්යවරියක් වීමයි."

## පුස්තකාල පරිහරණය විභාග ජයග්‍රහණය පහසු කළා

### මාතර දිස්ත්‍රික් ජීව විද්‍යා අංශ පළමුවැන්නා සහන් දීක්ෂායු රණතුංග



**ගන්දර සමූහ - ජයසිරි ජේදුරුආරච්චි**


"පන්ති කාමර ඉගෙනුමත්, පුස්තකාලයත් මගේ ජයග්‍රහණයට ඉවහල් වුණා" යැයි ජීව විද්‍යා අංශයෙන් මාතර දිස්ත්‍රික් පළමුවැන්නා වූ රාහුල විද්‍යාලයේ සහන් දීක්ෂායු රණතුංග සිසුවා පැවසීය.

"පාසල් ගිය සෑම දිනකම පන්ති කාමරයේ සිදු කළ ඉගෙනුමත්, පුස්තකාලයත් මගේ ජයග්‍රහණයට ඉවහල් වුණා. පාසලේ විද්‍යාගාරයේදී විභාගය ඉලක්ක කර පවත්වපු ප්‍රායෝගික ක්‍රියාකාරකම් විභාගයේදී ලොකු සවියක් වුණා." යැයි සිය ජයග්‍රහණය සම්බන්ධයෙන් අදහස් දැක්වමින් ඔහු කියා සිටියේය.

බෙලිඅත්ත රුහුණු විජයබා විද්‍යාලයෙන් පළමු ශ්‍රේණියේ සිට අධ්‍යාපනය හදාරා 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 187ක් ලබා සමත්ව කොළඹ පාසලකට යෑමේ අවස්ථාව තිබියදී මාතර රාහුල විද්‍යාලයේ 6 ශ්‍රේණියට ඇතුළත්ව ඇති සහන් දීක්ෂායු, පාසල් පන්ති කාමර ඉගැන්වීම් කටයුතුවලදී මෙන්ම උපකාරක පන්තිවලදී ද එය මඟ නොහැර සැලසුම්ගත ලෙස ආරම්භයේ සිට කටයුතු කර මෙම ජයග්‍රහණය ලබාගෙන තිබේ. හෘද රෝග විශේෂඥයකු වීමේ අරමුණින් ඉගෙනුම ලබන සහන්, උසස් පෙළට මුහුණ දෙන නංගිලා මල්ලිලාගෙන් ඉල්ලා සිටින්නේ පන්ති කාමර ඉගැන්වීම්වලට අමතරව හැකිතරම් පුස්තකාලය පරිහරණය කර තම විභාග ජය පහසු කර ගන්නා ලෙසයි.

## බාහිර වැඩ උසස් පෙළට බාධාවක් වුණේ නෑ

### මාතර දිස්ත්‍රික් ගණිත අංශ පළමුවැන්නා නිදුල සත්සර



**ගන්දර සමූහ - ජයසිරි ජේදුරුආරච්චි**

"උසස් පෙළ කරන කාලෙට බාහිර වැඩවලට සම්බන්ධ වුණොත් හොඳ ප්‍රතිඵලයක් ගන්න එය බාධාවක් බව ඇතැම් අය කිවුවත් එය බොරුවක් බව මගේ ප්‍රතිඵලයෙන් පෙන්නුම් කරන්නට හැකි වීම පිළිබඳ මට ඇත්තේ සතුටක්" යැයි මෙවර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත ගණිත අංශයෙන් මාතර දිස්ත්‍රික්කයේ ප්‍රථමයා ලෙසත්, සමස්ත ලංකා හත්වැනියා ලෙසත් සමත් වූ මාතර රාහුල විද්‍යාලයේ ජයවර්ධන රත්නායක ආරච්චිගේ නිදුල සත්සර සිසුවා පැවසුවේය.

පාසලේ 10 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ශිෂ්‍ය නායකයකු ලෙසත්, 6 ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා බාලදක්ෂයකු ලෙසත් කටයුතු කරමින් ජනාධිපති බාලදක්ෂයකු බවට පත්ව ඇති නිදුල පාසලේ මෙන්ම උපකාරක පන්තිවල ඉගෙනුම් කටයුතුවලට සහභාගී වනවා සේම පාසලේ සියලු බාහිර වැඩ සඳහා ද එක්ව සිටිමින් මෙම ජයග්‍රහණය ලැබීම විශේෂ අවස්ථාවකි.

ඔහු සිය ජයග්‍රහණය සම්බන්ධයෙන් මෙසේ ද කීය.

"හොඳ අධ්‍යාපනයක් ලබපු ශිෂ්‍ය අවධියේ සිටින සමහරුන් ප්‍රශ්නවලට මුහුණ දී ගන්න බැරු ව සියදිවි හානි කර ගන්නා ආකාරය පසුගිය කාලයේ අපි දැක්කා. පාසලේදී හෝ උසස් අධ්‍යාපනයේ යෙදෙන ඕනෑම කෙනෙක් බාහිර වැඩවලට සම්බන්ධ වෙලා එකිනෙකා අතර සම්බන්ධතා ඇතිකර ගනිමින් කටයුතු කරනවා නම් කෙනකුට ඇතිවන ඕනෑම මානසික පීඩාවක් ජීවිතය නැති කර ගැනීමකින් තොරව හොඳට කළමනාකරණය කරගන්න පුළුවන්. මම නංගිලා මල්ලිලාගේ ඉල්ලන්නේ ඉගෙනුම වගේම බාහිර ක්‍රියාකාරකම්වල යෙදීමත් තම ජීවිතවලට හොඳ ශක්තියක් බව තේරුම් ගන්නා ලෙසයි"

## උද්භිද විද්‍යා ක්ෂේත්‍රයෙන් ඉදිරියටම යනවා

### ගම්පහ දිස්ත්‍රික් ජෛව පද්ධති තාක්ෂණවේදය පළමුවැන්නා - චමෝදි හංසිකා අධිකාරම්



**ගම්පහ දිස්ත්‍රික් විශේෂ - සිසිල ගුණතිලක සහ ගම්පහ අතිරේක**

2024 උසස් පෙළ විභාගයෙන් ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවෙන් ගම්පහ දිස්ත්‍රික්කයෙන් ප්‍රථම ස්ථානයත්, සමස්ත දිවයිනෙන්ම තෙවැනි ස්ථානයත් ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේ චමෝදි හංසිකා අධිකාරම් ශිෂ්‍යයාව හිමි කර ගත්තාය.

තම ජයග්‍රහණය සම්බන්ධයෙන් ඇය මෙසේ පැවසුවාය.

"මම පදිංචි දිවුලපිටිය ප්‍රදේශයේ. මූලික අධ්‍යාපනය ලැබුවේ හොරගස්මුල්ල ප්‍රාථමික විද්‍යාලයෙන්. ශිෂ්‍යත්වය සමත් වෙලා රත්නාවලී බාලිකා විද්‍යාලයට ඇතුළත් වුණා. සාමාන්‍ය පෙළ විභාගය සඳහා A සාමාර්ථ 8ක් හා B සාමාර්ථ 1ක් ලබා ගත්තා. ඒ අනුව ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවෙන් උසස් පෙළ හැදෑරුවා. පාසලේ එදිනෙදා ඉගැන්වූ පාඩම්, අභ්‍යාස නිතර නිතර අධ්‍යයනය කළා. විභාගය ළංවෙද්දි පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවුවා. හැම තිස්සෙම මගේ අරමුණ මතක් කරගෙන ගොඩක් මහන්සි වෙලා පාඩම් වැඩ කළා. ඒ අනුව උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගනිමින් සමස්ත දිවයිනෙන්ම තෙවැනි ස්ථානය හිමි කර ගත්තා. මේක මට විශාල සතුටක්. මෙම ජයග්‍රහණය ලබා ගැනීම සඳහා 1 වසරේ සිට මේ දක්වා ඉගැන්වූ සියලුම ගුරුවරුන්ටත්, මා උනන්දු කළ මවුපියන්ටත් මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම රත්නාවලී බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනී වසන්තා කුමාරි මහත්මිය ඇතුළු තාක්ෂණික අංශ ප්‍රධානී මනෝරි අලගියවන්න, පන්ති භාර මෙන්ම ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ඉගැන්වූ රංගිකා හේමචන්ද්‍ර, තාක්ෂණවේදය විෂය ඉගැන්වූ දුලානි, තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉගැන්වූ සඳමාලි පෙරේරා යන ගුරු මෑණිවරුන්ගෙන් ලද ගුරුහරුකම් හා උපදෙස් මෙම ජයග්‍රහණය ලබා ගැනීමට ඉවහල් වුණා. මම පාසලේ තාක්ෂණ සංගමයේ සභාපති ලෙසත්, ඡායාරූප කලා සංසදයේ උප සභාපති ලෙසත්, සෞඛ්‍යදාන සංගමයේ උප ලේකම් ලෙසත් කටයුතු කළා. උසස් පෙළ හදාරන නංගිලා මල්ලිලාට කියන්න තියෙන්නේ තමන් කැමැති විෂය ධාරාවක් තෝරාගෙන වැඩ කටයුතු නිශ්චිත අරමුණකින් වගේම හොඳ කැපවීමකින් කළොත් උසස් ප්‍රතිඵලයක් කරා ළඟා වෙන්න පුළුවන් කියන එකයි. මගේ අනාගත බලාපොරොත්තුව උද්භිද විද්‍යාව පිළිබඳව ඉහළටම හැදෑරීමයි."

## විභාගය ළං වෙද්දි බැලුවේ ෂෝට් නෝට් විතරයි

### කළුතර දිස්ත්‍රික් භෞතික විද්‍යා අංශ පළමුවැන්නා බී.ඩී. විශ්ව ප්‍රවීන් සරත්චන්ද්‍ර



**හල්තොට සමූහ - විනීතා මානෙල් ගමගේ**

2024/25 අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් භෞතික විද්‍යා අංශයෙන් කළුතර දිස්ත්‍රික්කයෙන් ප්‍රථම ස්ථානය හිමි කරගැනීමට හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ බී.ඩී. විශ්ව ප්‍රවීන් සරත්චන්ද්‍ර සිසුවාට හැකි වී තිබේ.

තමන් ලද ජයග්‍රහණය පිළිබඳ විශ්ව ප්‍රවීන් සරත්චන්ද්‍ර සිසුවා අදහස් දැක්වූයේ මේ අයුරිනි.

"මම ඉගෙන ගත්තෙ හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ 13 MS-3 පන්තියේ. ගණිත අංශයෙන්. සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව තමයි මගේ විෂයන්. එදිනෙදා කරන පාඩම් මුලින්ම මම හොඳින් අල්ල ගත්තා. ඊට පස්සෙ ඒවයෙ ෂෝට් නෝට් ගහගත්තා. වාර විභාගෙ ළං වෙනකොට ඒව තමයි මම පාඩම් කළේ. හැම වාරෙම මම පළවෙනියා වුණා, 12 වසරෙ 3 වෙනි වාරෙදි ඇර. ඒ වාරෙදි විතරයි මම දෙවැනියා වුණේ. අන්තිම මාස දෙකේදි තමයි මම පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර කරන්න ගත්තේ. කොම්පියුටර් සම්බන්ධ ඉංජිනේරු උපාධියක් ලබා ගන්න තමයි මගේ බලාපොරොත්තුව තියෙන්නේ.

විදුහල්පතිතුමා නිලූක වීරසිංහ, භෞතික විද්‍යාව බිමායා මිස්, සංයුක්ත ගණිතය කුමුදුනි මිස්, රසායන විද්‍යාව අයේෂා මිස් ඇතුළු පාසලේ ගුරුවරු, මං ගිය උපකාරක පන්ති ගුරුවරු, අම්ම තාත්තා, යාළුවො ඇතුළු හැමෝටම ගොඩක් ස්තූති කරනවා."

## ව්‍යාපාර විශ්ලේෂකවරියක් වීම මගේ අරමුණයි

### අනුරාධපුර දිස්ත්‍රික් වාණිජ අංශ පළමුවැන්නා එස්.ඒ. මෙත්මි රවින්ද්‍යා



**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් වාණිජ අංශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ එස්.ඒ. මෙත්මි රවින්ද්‍යා සිසුවිය හිමි කරගෙන තිබේ.

ව්‍යාපාර විශ්ලේෂකවරියක් වීම සිය අරමුණ බවත්, පාසලෙන් හා උපකාරක පන්තිවලින් ලැබූ අධ්‍යාපනයත්, එදිනෙදා මහන්සි වී අධ්‍යාපන වැඩ කටයුතු සිදු කිරීම නිසාත් තමන්ට මෙම ජයග්‍රහණය ලබා ගැනීමට හැකි වූ බව ඇය සිය ජයග්‍රහණය සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා සිටියාය. ඇය වැඩිදුරටත් පැවසුවේ, එසේ උදවු උපකාර කළ මවුපියන්, ගුරුවරුන් සහ මිතුරු මිතුරියන් ඇතුළු සියලු දෙනාට ස්තූතිවන්ත වන බවත්, ලැබූ ජයග්‍රහණය පිළිබඳව මහත් සතුටට පත්වන බවත්ය. අනුරාධපුර නව නගරය ප්‍රදේශයේ පදිංචි එම සිසුවිය වාණිජ අංශයෙන් දිවයිනෙන් 53 වැනි ස්ථානය ලබාගෙන තිබිණි.

## කථිකාචාර්යවරියක් වීම මගේ අරමුණයි

### මොනරාගල දිස්ත්‍රික් ජෛව පද්ධති තාක්ෂණවේදය පළමුවැන්නා එම්.ඩී. යෂ්මි නයෝද්‍රා



**ඌව වෙල්ලස්ස විශේෂ - ඩී.එස්. ගුණතිලක**

2024 අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය මොනරාගල රාජකීය ජාතික පාසලේ එම්.ඩී. යෂ්මි නයෝද්‍රා ශිෂ්‍යාව හිමි කරගෙන දිවයිනේ 10 වැනි ස්ථානයට පත්ව ඇත.

මොනරාගල හුලංදාව ඩිපෝව පාර කුමාරපුර පදිංචි යෂ්මි කුඩා කාලයේ සිට ඉගෙනීමට දක්ෂ රාජකීය ජාතික පාසලේ පළමු වසරේ සිට ඉගෙනුම ලැබූ දක්ෂ ශිෂ්‍යාවකි. පාසලේදී දෙන පාඩම් එදිනෙදාම අධ්‍යයනය කළ ඇය අපොස උසස් පෙළ විශිෂ්ට ලෙස සමත් වීමට එය පිටිවහලක් කරගෙන ඇත. මොනරාගල රාජකීය ජාතික පාසලේ විදුහල්පති චමින්ද දේශප්‍රිය අත්තනායක මහතාගේ මඟපෙන්වීම සහ තාක්ෂණ විෂය අංශ ප්‍රධානී ප්‍රභාත් අත්තනායක ගුරුතුමාගේ අධීක්ෂණය යටතේ ඉන්දිකා ලසන්ති ගුරු මහත්මිය සහ දිනුෂ් පත්මකුමාර මහතා ඇයගේ ගුරුවරුන් ලෙස කටයුතු කර තිබේ.

විෂය කටයුතුවලට මෙන්ම බාහිර කටයුතුවලටද උනන්දුවක් දැක්වූ ඇය ගුරුභවතුන්ගේ ප්‍රසාදයට පත්වූ ශිෂ්‍යාවකි. විශ්වවිද්‍යාලයට පිවිසීමෙන් පසු විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියක ලෙස රටට සේවය කිරීම ඇයගේ අරමුණ බව කියා සිටියාය.

## උසස් පෙළ සමත් ප්‍රතිශතයෙන් පළමු තැන වයඹ පළාතට

### ජාතික මට්ටමේ ප්‍රතිශතයත් ඉක්මවමින් සමත් ප්‍රතිශතය ඉහළට

**වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂිකා මුදිතා ජයතිලක**

**කුරුණෑගල - කුමාරි දිසානායක, ඉබ්බාගමුව සමූහ**

2024 අ.පො.ස. උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල ජාතික මට්ටමේ ප්‍රතිශතයත් ඉක්මවා වයඹ පළාත් ප්‍රතිශතය සියයට 66.36ක් දක්වා ඉහළ තලයකට පැමිණ ඇති බවත්, ඒ අනුව වයඹ පළාත උසස් පෙළ ප්‍රතිඵල සටහනේ පළමු වැනි ස්ථානයට පත්ව ඇති බවත් වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂිකා මුදිතා ජයතිලක මහත්මිය සඳහන් කරයි.

එය 2023 වසරට වඩා ඉතාමත් ඉහළ සාධනීය මට්ටමක් බවද අධ්‍යක්ෂවරිය සඳහන් කළාය. ජාතික මට්ටමේ ප්‍රතිඵල අතර, ජීව විද්‍යා අංශයෙන් ප්‍රථම ස්ථානයත්, ඉංජිනේරු තාක්ෂණවේදය අංශයෙන් ප්‍රථම ස්ථානය සහ දහ වැනි ස්ථානයත්, ජෛව පද්ධති තාක්ෂණවේදය අංශය යටතේ ප්‍රථම ස්ථානයත්, හය වැනි ස්ථානයත් ඇතුළු ඉහළ ප්‍රතිඵල මෙවර අ.පො.ස.උසස් පෙළ ප්‍රතිඵල ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත. විශේෂයෙන්ම 2023 වසරේ ජාතික වශයෙන් අ.පො.ස. උසස් පෙළ සමත් වීමේ ප්‍රතිශතය සියයට 64.33ක්ව තිබියදී වයඹ පළාත හත්වන ස්ථානයට පත් වූයේ සියයට 64.21ක ප්‍රතිශතයක් ලබාගෙනය.

එහෙත් මෙවර ජාතික වශයෙන් උසස් පෙළ සමත් වීමේ ප්‍රතිශතය 64.73ක් වශයෙන් වාර්තා වන විට වයඹ පළාතේ සමත් වීමේ ප්‍රතිශතය සියයට 66.36ක අගයක් ගනිමින් පළාත් අතර වයඹ පළාත ප්‍රථමයා වීමට තරම් ප්‍රතිඵල පෙන්වා ඇති බව අධ්‍යක්ෂවරිය සඳහන් කළාය. එය ජාතික ප්‍රතිඵලයට වඩා සියයට 1.63ක වැඩි ප්‍රතිශතයක් වීම සතුටුදායක කාරණයක් බවද ඇය වැඩිදුරටත් කියා සිටියාය.

## බදුල්ල මහා විදුහලේ සියයට 80ක් උසස් පෙළ සමත්

**ඌව පළාත් සමූහ - ප්‍රසන්න පත්මසිරි**

2024 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයට බදුල්ල මහා විදුහලෙන් ඉදිරිපත් වූ සිසු සිසුවියන් 964 දෙනාගෙන් 765 දෙනකු විශ්වවිද්‍යාල වරම් ලබා ඇතැයි එහි විදුහල්පති එල්.ජී.එස්. සමරකෝන් මහතා පැවසීය.

මෙවර පාසලේ දරුවන්ගෙන් විභාගය සමත් ප්‍රතිශතය සියයට 80ක් වන අතර, දිස්ත්‍රික් කුසලතා සහ දිවයිනෙන්ම කුසලතා රැසක් පාසලට හිමිව තිබේ. ජීව විද්‍යා අංශයෙන් බදුල්ල දිස්ත්‍රික්කයෙන් ප්‍රථමයා සහ දිවයිනෙන්ම 9 වැනි ස්ථානයට ජනුකි කුරේ සිසුවිය සමත්ව තිබේ.

පාසලේ විභාගය ලියූ දරුවන්ගෙන් 59 දෙනකු සියලුම විෂයයන්වලට ඒ සාමාර්ථ ලබා සිටි බව විදුහල්පතිවරයා කීය. ඉංජිනේරු තාක්ෂණ අංශයෙන් දිස්ත්‍රික්කයේ පළමු ස්ථානයට අයි.යූ. තෙන්නකෝන් සහ දෙවැනි ස්ථානය ආර්.එම්. ලසිත් මලීෂ ලබා ගනිමින් එම දෙදෙනා දිවයිනෙන්ම 14 සහ 15 යන ස්ථාන හිමි කරගෙන ඇත.

පාසලේ දරුවන්ගේ විභාග ප්‍රතිඵල අනුව පසුගිය සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාගවලිනුත් ඌවේ විශිෂ්ට ජයක් ලබා ගත් එකම පාසල බවට ද බදුල්ල මහා විදුහල පත්ව තිබේ. විභාග ක්‍රීඩා ඇතුළු පාසලේ පවත්වන සියලුම තරගවලින් ජාතික මට්ටමේ ජයග්‍රහණ සිය ගණනක් පාසලට ලබා ගැනීමට විදුහල්පති එල්.ජී.එස්. සමරකෝන් මහතා ඇතුළු ගුරු මණ්ඩලය ද සුවිශේෂී දායකත්වයක් දක්වා තිබේ.